**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2013**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවකයකු විසින් උසාවියේ පවරා ඇති නඩුවක් විභාග වෙමින් පවතින අතර ඒ සඳහා අවසන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා හෝ සටහනක් මඟින් අනාවරණය කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී ආයතනය වෙත පවරා ඇති පිරිවැය රු.100,000 ක් වූ අක්කර දෙකකට වැඩි ඉඩම, රු.49,836,647 ක් වූ අනිකුත් ස්ථාවර වත්කම් හා අගය ශුන්‍ය වූ හා තවදුරටත් භාවිතා කරන පිරිවැය රු.16,130,639 ක වටිනා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනෙන ලද රු. 250,033 වියදමක් ලෙස හඳුනා නොගෙන තවදුරටත් ඉදිරියට ගෙවූ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

වෙනත් අත්තිකාරම් ගිණුමේ රු.52,785 ක අසාමාන්‍ය බැර ශේෂයක් පැවති අතර එය නිරාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීතී රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 20 වගන්තිය | පාරිතෝෂික ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතු කළ අගය, සැලකිය යුතු වුවත් මූලික වැටුප පදනම්කරගෙන පාරිතෝෂික දීමනා ගණනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | 2013 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 6.5 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව පිළියෙළ කර නොතිබුණි. |
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 9.3.1 වගන්තිය | රු.200,000 ට වැඩි වාහන අලුත්වැඩියාවන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතු වුවත් රු.992,876 ක් වූ වාහන දෙකක අළුත්වැඩියා වියදම් සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. |
| (ii) 4.3.1 හා 8.12.1 වගන්ති | අගලවත්ත නේවාසිකාගාරයේ නාන කාමර සෑදීම හා ටයිල් කිරීමේ රු. 207,900 ක් වූ කොන්ත්‍රාත්තුව සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර අතුරු ගෙවීම හා අවසාන ගෙවීම් සිදුකිරීමේ කාර්යය සඳහා වැඩ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය කරන ලද බවටත් තක්සේරු කරන බවටත් ප්‍රසම්පාදන අස්ථිත්වය වගකිව යුතු වුවද එම කාර්යය වෙනුවෙන් කාර්මික නිළධාරි විසින් අවසාන මිනුම් වාර්තාවක් නොමැතිව ගෙවීම සහතික කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.2,204,465 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.444,839 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,759,626 ක පිරිහීමක් ඇතිවී තිබු අතර මීට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ පරිපාලන වියදම රු.5,067,666 කින් ඉහළ යාම වේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

හිටපු සභාපතිවරයෙකුගෙන් ආයතනයට අයවිය යුතු රු.114,727 ක් අයකර ගැනීම සඳහා ආයතනය කටයුතු කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පුද්ගලයින් 08 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යාපන පුහුණු ආයතනයේ අධ්‍යයන මණ්ඩලය සමාලෝචිත වර්ෂය ඇතුළත එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණු අතර, එම රැස්වීම සඳහාද සහභාගී වී තිබුණේ පුද්ගලයින් 03 ක් පමණි. ඒ අනුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 8(1) වගන්තියට අනුව ආයතනයේ වගකීම් හා බලතල පැවරී ඇති අධ්‍යන මණ්ඩලය විසින් ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් සපයා නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ පහත අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 40 ක් විය.
- i. රාජ්‍ය නිලධාරීන්ට සිංහල /දෙමළ/ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් සඳහා සම්පත් දායකයන් පුහුණු කිරීම.
- ii. භාෂා සංගම් ජාතික ව්‍යාපාර යටතේ සමාන්‍ය ප්‍රජාවට සිංහල/දෙමළ භාෂා ඉගැන්වීමට ගුරුවරුන් පුහුණු කිරීම.
- iii. රාජ්‍ය නිලධාරීන් සඳහා වෘත්තීය ඉංග්‍රීසි භාෂා පාඨමාලාව.
- iv. පාඨමාලා සුදානම් කිරීමේ හා සැලසුම් කිරීමේ පුහුණු වැඩසටහන්.

(ආ) පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.
- i. විෂයමාලා සංවර්ධනය පුහුණු උපකාරක පෙළපොත්, ගුරු අත්පොත් සම්පාදනය (භාෂා සංගම් සිංහල) කිරීම.
- ii. වෙනත් විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම සඳහා මධ්‍යම ඉන්දියානු භාෂා ආයතනය සමඟ අත්දැකීම් හුවමාරු වැඩසටහන.
- iii. රාජ්‍ය නිලධාරීන්ගේ සන්ධාන භාෂා හැකියාව වර්ධනය කිරීම සඳහා ඉංගීරසි භාෂා පාඨමාලාව හා විෂය නිර්දේශය සැකසීම.

**5.2 විගණන කමිටු**

විගණන කමිටු රැස්වීම් කාලානුරූපීව පවත්වා නොතිබූ අතර 2013 නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී රැස්වීම් 03 ක් පවත්වා තිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලතාවයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**
**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) වාහන උපයෝජනය
(ඈ) පුස්තකාල පාලනය